108

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1133 - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

**කාලය - පැය දෙකයි.**

---

දිනය - 2007.12.15 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

01. a) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය ඉගැන්වීමේදී යොදා ගත හැකි ප්‍රවේශ හතරක් නම් කරන්න. (ලකුණු 10 යි)

b) ඒ එක් එක් ප්‍රවේශය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 15 යි)

02. a) "සන්නිවේදනය" යන්නෙහි අදහස කුමක් ද? (ලකුණු 10 යි)

b) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සන්නිවේදන කුසලතා උපයෝගී කරගත හැකි අයුරු නිදසුන් දෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15 යි)

03. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සම්බන්ධිත ඉගෙනුම් ක්‍රියාවලියේදී, ශිෂ්‍යයන්ට
(a) පහසුකම් සලසන්නෙකු ලෙස හා
(b) මග පෙන්වන්නෙකු ලෙස ගුරුවරයාගේ කාර්ය භාරය පැහැදිළි කරන්න. (ලකුණු 25 යි)

04. (a) "ඇගයීම්" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 10 යි)

(b) ප්‍රාථමික පාසලේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළව ඇගයීම් ක්‍රම යොදා ගැනීම තුළින් ඉටු කරගත හැකි අරමුණු තුනක් පැහැදිළි කරන්න. (ලකුණු 15 යි)

05. ප්‍රාථමික පාසල් විෂයමාලාවට පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හඳුන්වාදීමේ වැදගත්කම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 25 යි)

06. පහත දැක්වෙන ඕනෑම තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(a) ක්ෂේත්‍ර චාරිකා (b) සමාජයීය පරිසරය
(c) පරිසර පද්ධති (d) පොදු දක්ෂතා

(ලකුණු 25 යි)

- හිමිකම් ඇවිරිණි. -